# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1939/16 - 2015 නොවැම්බර් මස 04 වැනි බදාදා - 2015.11.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම්

### ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත 27 අ වගන්තියේ (4) වැනි උප වගන්තිය යටතේ වූ නියමය

1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 27අ (4) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් අමාත්‍ය මුණසිංහ කාරියවසම් අප්පුහාමිලාගේ දොන් සෝමදාස ගුණවර්ධන වන මම, මේ නියමය මගින්.

(අ) 1958 අංක 4 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට පවරාදී අත්තාවූ ද, මේ නියමයේ පළමුවන උපලේඛනයේ සවිස්තර ලෙස දක්වා ඇත්තාවූ ද, නාලන්ද වත්ත යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ඉඩම හා සම්බන්ධ 1982 පෙබරවාරි මස 27 වැනි දින අංක 181/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 27 අ (1) වැනි වගන්තිය යටතේ කරන ලද නියමයේ මෙහි දෙවන උපලේඛනයේ නිශ්චිත ව දක්වා ඇති නාලන්ද වත්ත නැමැති ඉඩමේ බිම් ප්‍රමාණයට අදළ වන්නා වූ කොටස, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත පවරනු ලැබීම සඳහා වූ ප්‍රතිඥාවට අදළ නියමය හෝ කොන්දේසි අනුව ක්‍රියාකර නොමැතිවීමේ පදනම මත, ප්‍රත්‍යාදිෂ්ට කිරීම මගින් ඒ නියමය සංශෝධනය කරමි ; සහ

(ආ) මේ ප්‍රත්‍යාදිෂ්ට කිරීම මත මේ නියමයේ දෙවන උපලේඛනයේ නිශ්චිත ව දක්වා ඇති ඉඩම් ප්‍රමාණය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත නැවත පැවරෙන බව මෙයින් ප්‍රකාශ කරමි.

ඇම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන,
ඉඩම් අමාත්‍ය.

2015 ඔක්තෝබර් මස 05 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
ඉඩම් මහලේකම් කාර්යාලය,
මිහිකත මැදුර,
1200/6, රජමල් වත්ත පටුමග,
බත්තරමුල්ල.


1A - G 22557 — 16 (2015/11)
මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## පළමුවන උපලේඛනය

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත පවරා ඇති නාලන්ද වත්ත නම් ඉඩමේ විස්තරය

| අති විශේෂ ගැසට් පත්‍රයේ අංකය සහ දිනය | වතු ඉඩමේ නම | පරිපාලන දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත පවරන ලද ඉඩමේ ප්‍රමාණය හෙක්ටයාර් වලින් |
|---|---|---|---|---|
| 1982.02.27 දිනැති අංක 181/12 | නාලන්ද වත්ත | මාතලේ | නාඋල | 457.09 |

## දෙවන උපලේඛනය

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත නැවත පැවරෙන ඉඩම් කොටසෙහි විස්තරය

| විශේෂ්‍ය අංකයන් | ඉඩමේ නම | පරිපාලන දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රාම නිලධාරි කොට්ඨාසය | කොමිෂන් සභාව වෙත පැවරෙන ලද ඉඩම් ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| මහ/390<br>කො/3039<br>කො/1521 | නාලන්ද වත්ත | මාතලේ | මාතලේ | මඩවල උල්පත E 322 C | මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ වගපනහ උඩසිය පත්තුවේ නාලන්ද ගමේ පිහිටි<br>උතුරට - නාලන්ද වත්තේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම<br>නැගෙනහිරට - නාලන්ද වත්තේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම හා කැබලි අංක 02 ද<br>දකුණට - ප්‍රධාන මාර්ගයද<br>බස්නාහිරට - නාලන්ද වත්තේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම හා ප්‍රධාන මාර්ගය ද තුළ පිහිටි නාලන්ද වත්තේ කොටසක් සඳහා<br>බලයලත් මිනින්දෝරු කේ. ඕ. පෙරේරා මහතා විසින් මැන සකස් කරන ඇති අංක 3655 සහ 2008.04.03 දිනැති පිඹුරේ කැබලි අංක 01 කොටසින් පෙන්නුම් කර ඇති අක්කර 01 රූඩ් 2 පර්චස් 04 (හෙක්ටයාර් 0.6196) කින් යුත් බිම් ප්‍රමාණය වේ. |

11 - 474

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.